# 10 ශ්‍රේණිය
# ඉතිහාසය

## ඒකකය 3
## ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශනය වීම -01

# ක්‍රියාකාරකම් පත්‍රිකා
# පිළිතුරු පත්‍රය







## පූර්ව රාජ්‍ය සමය

අයි.එම්.ධම්මික කුමාර ඉලංකෝන් (ගුරු උපදේශක)
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල

# ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශනය වීම

## පූර්ව රාජ්‍ය සමය

1.ඉතිහාසය පෙළ පොත හා මෙම පාඩමට අදාළ කියවීම් පත්‍රිකාව හොඳින් කියවා පහත සඳහන් ක්‍රියාකාරකම් වල නිරත වන්න. නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

01. ගම් වැව් පද්ධති නිර්මාණය කිරීමේ එක් අරමුණක් වන්නට ඇත්තේ,

1. ජලය සංරක්ෂණය
2. ගංවතුර පාලනය කර ගැනීමය
3. දේශගුණයේ සමබරතාව රැක ගැනීමය.
4. පාංශු ඛාදනය වළක්වා ගැනීමය.

02. මෙවැනි වැව් පද්ධති බහුලව දක්නට ලැබෙන්නේ,

1. තෙත් කලාපයේ ය
2. වියළි කලාපයේ ය
3. කඳුරට තෙත් කලාපයේය
4. පහතරට අතරමැදි තෙත් කලාපයේ ය.

03. කුඩා වැව් පද්ධති භාරව කටයුතු කරන ලද්දේ,

1. මපුරුමුක ය
2. පරුමක ය
3. ගමික ය
4. ගහපති ය

04. පුරාණ ශ්‍රී ලංකාවේ පාලන බලය මුල් මට්ටමේ සිට රාජ්‍යත්වය දක්වා විකාශනය වූ අනුපිළිවෙල දැක්වෙන්නේ කවර පිළිතුරේ ද?

1. ගෘහපති, මපුරුමුකා, ගමික, පරුමක
2. මපුරුමුකා, පරුමක, ගෘහපති, ගමික
3. ගෘහපති, ගමික, පරුමක, මපුරුමුකා
4. පරුමක, ගෘහපති, ගමික, මපුරුමුකා

05. පැරණි ගමක ජීවත් වූ දිළිඳු වැසියෙකු ඊළඟ කන්නයේ ලබා දෙන පොරොන්දුව පිට ඒ ගමේ විසූ ගමිකයාගෙන් වී මල්ලක් ණයට ඉල්ලා ගත් පුවතක් සඳහන් සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ මින් කුමක් ද?

1. සමන්තපාසාදිකාව
2. දීප වංසය
3. ජාතකට්ඨකතාව
4. පූජාවලිය

● පහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

01.

I. පහත ප්‍රශ්න වලට පිළිතුරු A ,B, C අනුපිළිවෙළින් ලියා දක්වන්න.

a. වැඩි දෙනෙකුගේ එකගත්වයෙන් තෝරාගත් පාලකයා හඳුන්වන්නේ කෙසේ ද?

මහාසම්මත

b. විජය කුමරු ලංකාවට පැමිණෙන අවධිය වන විට ලංකාවේ කෘෂිකාර්මික සමාජයක් දියුණු වෙමින් පැවති බවට සාධක හමුවන පැරණි සොහොන් බිම් දෙකක් නම් කරන්න.

බෙරගල හා හල්දුම්මුල්ල

II. ගම්මික වරයාට අයත් වගකීම් යුතුකම් 04 ක් නම් කරන්න.

ගම්වල පොදු කටයුතුවලට නායකත්වය දීම
ගමට අයත් වැව නඩත්තු කිරීම
වැවේ ජලය බෙදා හැරීම
ගම්වල පැවති ආරවුල් විසඳීම
ගම නියෝජනය කරමින් සහභාගී වීම

III. පැරණි ජනයා ගම් වැව් ඉදිකිරීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

1. ගම්වැව් වල තිබූ ජලය කෙටි කාලයකට ප්‍රමාණවත්
2. වියළි කාලවල ගම්වැව් සිඳීයාම
3. ගම්වල ජනගහනය ඉහළ යෑම නිසා පරිභෝජනය සඳහා වැඩි ජල ප්‍රමාණයක් අවශ්‍ය වීම
4. ඉහළ යන ජනගහනයකට වැඩියෙන් ආහාර නිපදවීම අවශ්‍ය වූ නිසා වැඩි භූමි ප්‍රමාණයක් වගාකිරීමට වැඩිපුර ජලය අවශ්‍ය වීම

ක්‍රිස්තු පූර්ව 900 පමණ කාලයේ දී මෙරට වියළි කලාපයේ ජනාවාස පැතිර ගියේ කුඩා වැව් කේන්ද්‍රකර ගෙන ය. මේ වැව් පෝෂණය වූයේ වැසි දියෙනි. සාමාන්‍යයෙන් ගමක ජීවත් වූ පවුල් 10-15 ත් අතර ප්‍රමාණයකට ඔවුන්ගේ එදිනෙදා ජීවන අවශ්‍යතා පිරිමසා ගැනීමට එවැනි වැව්වල තිබූ ජලය කෙටි කාලයකට ප්‍රමාණවත් විය. වාර්ෂිකව එළැඹෙන වියළි කාලවල දී මේ වැව් සිඳී ගියේ ය. එවැනි අවස්ථාවල එම වැව් ආශ්‍රිත ව ජීවත් වූ ජනතාව මහත් අසීරුතාවලට මුහුණ දුන් බව අදත් වියළි කලාපයේ පැරණි වැව් ආශ්‍රිත ව ජීවත්වන ජනතාව මුහුණ දෙන අත්දැකීම්වලින් පැහැදිලි වේ.කුඩා වැව්වලට වර්ෂා කාලයේ දී පුරවා ගන්නා ජලය ප්‍රමාණවත් නොවීමේ ගැටලුවට මුහුණ දීමට සිදු වූයේ වියළි කාලගුණ තත්ත්වය නිසා පමණක් ම නොවේ. කාලයක් යාමේ දී ගම්වල ජනගහනය ඉහළ යෑම නිසා ද පරිභෝජනය සඳහා වැඩි ජල ප්‍රමාණයක් අවශ්‍ය විය. ඉහළ යන ජනගහනයකට වැඩියෙන් ආහාර නිපදවීම අවශ්‍ය වූ නිසා වැඩි භූමි ප්‍රමාණයක් වගා කළ යුතුහෙයින් ඊට සුදුසු ප්‍රමාණවත් ජල ප්‍රමාණයක් රඳවා ගැනීම අත්‍යවශ්‍ය විය. මෙවැනි අවශ්‍යතා ඉදිරියේ උද්ගතවන දුෂ්කරතාවලට වරක් දෙවරක් නොව කිහිප වරක් මුහුණ දුන් අපේ පුරාණ ගම්වැසියෝ එම අභියෝගයට මුහුණ දීම සඳහා සාර්ථක ක්‍රමයක් අනුගමනය කළහ. ඒ තනි ව පවතින වැවක් වෙනුවට සමීපව තිබෙන වැව් කිහිපයක් ඇළ මාර්ගවලින් සම්බන්ධ කොට වැව් පද්ධතියක් සෑදීම යි.

IV. වැව් පද්ධතියක් යනු කුමක් ද යන්න හඳුන්වා ගම් වැව් පද්ධති ඉදිකිරීමේ අරමුණු කෙටියෙන් විස්තර කරන්න.

තනි ව පවතින වැවක් වෙනුවට සමීපව තිබෙන වැව් කිහිපයක් ඇළ මාර්ගවලින් සම්බන්ධ කොට වැව් පද්ධතියක් සාදන ලදි. එහි අරමුණු දෙකක් තිබිණි. පළමු වැන්න භූමියක ඉහළින් පිහිටි වැවක් වැසි දියෙන් පිරුණු විට ඉන් බැහැරට ගලා යන ජලය පහළින් ඇති වැවට හරවා ජලය සංරක්ෂණය කර ගැනීම යි. දෙවැන්න වැව් දෙකක් අතර ඇළ මාර්ගයේ නිරන්තරයෙන් ජලය ගලා යාමට සලස්වා ඇළ දෙපස භූමියේ තෙතමනය ඉහළ දැමීම යි. එසේ තෙතමනය ඉහළ නැංවීමෙන් එම ප්‍රදේශවල පහසුවෙන් බෝග වගා කළ හැකිවිය.